*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2018

# ඉස්ලාම් ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 අකීදා කොටස් වලට අඩංගු නොවන්නේ,

(1) තව්හීද් (2) රිසාලත් (3) හිදායත් (4) මආද්

02 ඉහ්ලාස් යන වචනයේ තේරුම,

(1) විශ්වාසය (2) වැලකී සිටීම (3) සිත පිරිසුදු වීම (4) භක්තිය

03 සව්ම් (නොන්බි) අනිවාර්‍යය වූ වර්ෂය,

(1) හිජ්රි - 1 (2) හිජ්රි - 2 (3) හිජ්රි - 3 (4) හිජ්රි - 4

04 සකාත් යන වචනයේ තේරුම නොවන්නේ,

(1) සංවර්ධනය (2) පිරිසුදු බව (3) අවංක (4) ආලෝකය

05 "ප්‍රාර්ථනාව මුඃමින්ගේ ආයුධයයි" යනු

(1) අල් කුර්ආන් වැකියකි (2) හදීස් වැකියකි

(3) සහාබා වරුන්ගේ වදනකි (4) ප්‍රස්ථාපිරුළුවකි

06 සමූද් කණ්ඩායම කුමන නබි වරයාගේ සමාජයට අයිති වේද?

(1) නූහ් (අලෛ) (2) සාලිහ් (අලෛ)

(3) ඉබ්රාහිම් (අලෛ) (4) ඊසා (අලෛ)

07 "පිරිසුදු කම ඊමානයේ අඩක් වේ." යනු,

(1) අල්කුර්ආන් වැකියකි (2) හදීස් වැකියකි

(3) සහාබාවරුන්ගේ වදනකි (4) ප්‍රස්ථා පිරුළුවකි

08 ජාහිලිය්‍ය කාලයේ ජීවත් වූ මිනිස්සු මුහම්මද් නබි තුමාව ආමන්ත්‍රණය කළ විශේෂ නම,

(1) අබුල් බෂර් (2) අල් අමීන් (3) මසීහුල්ලාහ් (4) දබීහුල්ලාග්

09 තිලාවතුල් කුර් ආන් යනුවෙන් හඳුන්වන්නේ,

(1) අල්කුර් ආනය ඔසවා ගැනීම (2) අල්කුර්ආනය ස්පර්ශ කිරීම

(3) අල්කුර්ආනය පාරායනය කිරීම (4) අල්කුර්ආනය බැලීම

10 අල් මාඌන් යන වචනයේ තේරුම,

(1) විනය (2) පෙරවරු (3) උදේ වරුව (4) ඉතා සුළු දේවල්

11 ඉඃතිකාෆ් යන වචනයේ තේරුම

(1) රාත්‍රිකාල නැමදීම (2) මස්ජිදයේ රැඳී සිටීම

(3) අල්කුර් ආනය පාරායන කිරීම (4) භක්තිය

12 උලුල් අස්ම් වරුන් නොවන නබි වරයා,

(1) දාවුද් (අලෛ) (2) මූසා (අලෛ)

(3) ඊසා (අලෛ) (4) ඉබ්රාහිම් (අලෛ)

13 අල්කුර් ආනයේ තිබෙන සජ්දා වචන සංඛ්‍යාව

(1) 45 (2) 35 (3) 25 (4) 15

14 සලාතුල් කුසුපෙන් යනු,

(1) අවුරුදු දින ඉටු කරන සලාතය (2) ග්‍රහණ ඇති විට ඉටු කරන සලාතය

(3) වැස්ස අපේක්ෂා කර ඉටු කරන සලාතය (4) පිංතකා ඉටු කරන සලාතය

15 සර්ලු නොවන සලාතයක් වන්නේ,

(1) සලාතුල් ජනාසා (2) සලාතුන් නද්ර්

(3) සලාතුල් ඊද් (4) සලාතු තරාවීහ්

- **හිස්තැන් පුරවන්න.**

16 මරණයෙන් පසු විභාග කරන අවස්ථා වෙහි ඔහුගේ .................................................................... සාක්ෂි දරයි.

17 ගමන් කරන අවස්ථාවෙහි ....................................................................................... නැමදීම අනුමත කර තිබේ.

18 අල්කුර් ආනය පාරායනය කිරීම මගින් ........................................................................... ලබා ගත හැක.

19 හදීස් නබ වී යනු කව්ලී, පිඅලී ................................................................................. වලින් සමන් විතය.

20 සිකුරාදා දින ......................................................................................................... පාරායන කිරීම සුන්නත් වේ.

(සකීනත් / ජම්උර්කස්රු / තකරීරි / සූරාකහ්ප් / කුද්සි / අවයව / සලාතුල් කලා )

- **නිවැරදි නම් ( ✓ ) ලෙස ද වැරදි නම් ( × ) ලෙස ද සඳහන් කරන්න.**

21 සුරා මාඌන් අල්කුර් ආනයේ 109 වැනි පරිච්ඡේදය වේ. (     )

22 වහීමත්ලූ යනු අල් කුර් ආනය වේ. (     )

23 නුවණ සෝයා ගමන් කරන්නෝ අල්ලාහ්ගේ මාර්ගයේ ගමන් කරන්නෝ වෙති. (     )

24 අල්තුර්ආනය සලාතය සමග එක්ව සඳහන් කරන ක්‍රියාව නොන්බි වේ. (     )

25 සදකා යන ක්‍රියාව වාජිබ් වන සත් ක්‍රියාවකි. (     )

(ල. 2 × 25 = 50 )

## II කොටස

- **ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 (1) රාමලාන් මාසය ඉස්ලාමීය මාසවල කීවෙනි මාසය වේ ද? (ල. 02)

(2) නෝන්බි අනිවාර්ය වීමට ඇති කොන්දේසි 03 ක් ලියන්න. (ල. 03)

(3) රමලාන් මාසයේ ඉටු කළ යුතු ක්‍රියාවන් 05 ක් සඳහන් කරන්න. (ල. 05)

02 (1) සකාත් සදකා යන යෙදුම් වල තේරුම ලියන්න. (ල. 02)

(2) සකාත්, සදකා අතර තිබෙන වෙනස්කම් 03 ක් ලියන්න. (ල. 03)

(3) නිසි පරිදි සකාතය ඉටු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 05 ක් සඳහන් කරන්න. (ල. 05)

03 (1) "උලමා" යනු කවුරුන්ද? (ල. 02)

(2) ආලිම්වරුන්ගේ වටිනාකම තහවුරු කරන හදීස් සයක් ලියන්න. (ල. 03)

(3) ආලිම්වරුන් ගරු කිරීමට අපි කළයුතු කරුණු 05 ක් සඳහන් කරන්න. (ල. 05)

04 (1) අහ්ලාක් යනු කුමක් ද? (ල. 02)

(2) අප ජීවිතයේ අනුගමනය කළ යුතු කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(3) අප ජීවිතයේ අනුගමනය නොකළ යුතු කරුණු 05 ක් ලියන්න. (ල. 05)

05 (1) " දූ ආ " යන පදයේ තේරුම ලියන්න. (ල. 02)

(2) " පව් " වර්ග කීයක් ද? ඒවා කුමක් ද? (ල. 03)

(3) ගමන් කිරීමේ දී අනුගමනය කළයුතු කරුණු 05 ක් ලියන්න. (ල. 05)

06 (1) අල්කුර් ආනය සඳහා යොදවා ගන්නා වෙනත් නම් 02 ක් ලියන්න. (ල. 02)

(2) සූරා අල්මා ඌන් වලින් ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ල. 03)

(3) අල් කුර් ආනයේ වැදගත් කම ගැන වාක්‍ය පහක් ලියන්න. (ල. 05)

07 (1) " වහී " වර්ග සඳහන් කරන්න. (ල. 02)

(2) වහී කුද්සි හා අල් කුර් ආනය අතර තිබෙන වෙනස් කම් 03 ක් ලියන්න. (ල. 03)

(3) හදීස් වල ප්‍රධාන කොටස් දෙක සඳහන් කර ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (02) | 3 | (03) | 1 | (04) | 3 | (05) | 2 | (06) | 2 | (07) | 2 | (08) | 2 |
| (09) | 3 | (10) | 4 | (11) | 2 | (12) | 1 | (13) | 4 | (14) | 2 | (15) | 3, 4 | | |
| (16) | මිනිස් අවයවත් | (17) | ජම්ළ කස්රු | (18) | සකීනත් | (19) | කක්රීරි | (20) | සුරා කහ්ප් | (21) | × | | | | |
| (22) | ✓ | (23) | ✓ | (24) | × | (25) | × | | | | | | | | |

## II කොටස

(ලකුණු 2 x 25 = 50)

01 (1) හිජ්රි 2
(2) (1) මුස්ලිම් වීම (2) වැඩිවියට පත්වී සිටීම (3) නෝන්බ් ඇල්ලීමට ශක්තිය තිබීම
(3) (1) උපවාසයේ යෙදීම (2) සලාතය රාත්‍රි කාලයේ ඉටු කිරීම (3) අල් කුර් ආනය පාරායනය කිරීම
(4) ප්‍රාර්ථනා කිරීම (5) ඉහ්තිකාෆ් සිටීම (ගැලපෙන කරුණු 5 සඳහා ) (2 + 3 + 5 = 10 ලකුණු)

02 (1) සකාත් - සංවර්ධනය, සදකා - දන් දීම
(2) සකාත් - සදකා වෙනස (1) පර්ලු - සුන්නත් (2) යම්කිසි පිරිසකට අනිවාර්‍යය වේ - කැමති කෙනෙකුට දෙන්න පුළුවන. (3) කෙසේ ලබා දිය යුතුදැයි යන කොන්දේසි තිබේ. - එවැනි කොන්දේසි නැත.

03 (1) ආගමික විද්වතුන්
(2) සුදුසු හදීසියක්
(3) (1) ඔවුන්ට ගරු කිරීම (2) ඔවුන්ගේ අනුශාසනා වලට සවන් දීම (3) ඔවුන් සමග තර්ක නොකිරීම
(4) ඔවුන්ගේ උපදෙස් අනුව කටයුතු කිරීම
(5) ඔවුන් සමඟ සුහදව සිටීම තුළින් එලොවෙහි ජයග්‍රහනය ලැබීම (2 + 3 + 5 = ලකුණු 10)

04 (1) හොඳ ගතිගුණ හා ආචාර ධර්ම
(2) 1. සත්‍ය, 2. අවංක 3. විශ්වාසයෙන් ජීවත්වීමට උත්සාහ කිරීම
(3) 1. බොරු කීම 2. රැවටීම 3. ඊර්ෂ්‍යා කිරීම 4. ගතු කීම 5. බැනීම
(2 + 3 + 5 = 10 ලකුණු)

05 (1) ප්‍රාර්ථනා කිරීම
(2) කොටස් දෙකකි
(3) 1. ප්‍රාර්ථනාවේ ආරම්භයේ හා අවසානයේ අල්ලාහ්ට ප්‍රසංසා කිරීම
2. කුසල් කිරීමෙන් පසු ප්‍රාර්ථනා කිරීම
3. පිළිතුර ලැබෙයි යන අධිෂ්ඨානයෙන් ප්‍රාර්ථනා කිරීම
4. තුන් වතාවක් ප්‍රාර්ථනා කිරීම
5. අත්දෙක ඔසවා ප්‍රාර්ථනා කිරීම (2 + 3 + 5 = 10 ලකුණු)

06 (1) පුර්කාන්, තන්සීල්
(2) 1. සියලු, ක්‍රියාවලට සිත් පිරිසුදුව තිබිය යුතුය 2. දුගී දුප්පතුන්ට ආහාර ලබා දීම හා අන් අය පොළඹවීම
3. අපේ ක්‍රියාවන්ට දඬුවම් ලැබෙයි යනුවෙන් විශ්වාස කිරීම
(3) 1. අවසාන ආගම 2. කට පාඩම් කිරීමට පහසුය 3. පාරායනය කිරීමෙන් සකීනත් ලැබීමට
4. අල්ලාහ් විසින් ආරක්ෂා කරන ලදී 5. නැවත නැවත පාරායන කිරීම තුළින් පරණ නොවීම.
(2 + 3 + 5 = 10 ලකුණු)

07 (1) කුද්සි, නබවි
(2)

| අල්කුර්ආන් | හදීස් කුද්සි |
|---|---|
| 1. මුතවාතිර් වර්ගයට අයත්ය | වර්ග කිහිපයක් තිබේ. |
| 2. සලාතයේ පාරායන කළ හැකිය | පාරායන කළ නොහැක |
| 3. අල්කුර්ආනය මුහ්ජිසා එකකි | මුහ්ජිසා වර්ගයට අයත් නොවේ. |

(3) හදීස් නබවි - නබි (සල්) තුමන්ගේ වචන, ක්‍රියාව, අනුමත කිරීම, අංග ලක්ෂණ හා ගතිගුණ සම්බන්ධ සියලු කරුණු අඩංගු වේ.
හදීස් කුදිසි - අල්ලාහ් පවසනවා යනුවෙන් නබි (සල්) තුමා විසින් පවසන ලද නදීස්, (2 + 3 + 5 = 10 ලකුණු)